# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## හිස් මගී ප්‍රවේශපත්‍ර 20,000,000 ක් ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන අංකය : SRS F.8154

01. කොළඹ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයට හිස් මගී ප්‍රවේශපත්‍ර 20,000,000 ක් සැපයීම සඳහා යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම් ලත් නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන්ට, ඔවුන් විසින් නෛතිකව වලංගු කළ ඇටෝර්නි බලපත්‍රයකින් බලය පවරනු ලැබූ ලියාපදිංචි නියෝජිතයකු මාර්ගයෙන් හෝ සෘජුව තම ලංසු ඉදිරිපත් කළ හැකිය.

02. ලංසුකරණය ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (ICB) මගින් මෙහෙයවනු ලැබේ.

03. අභිලාෂී යෝග්‍යතාපූර්ණ/ සුදුසුකම්ලත් ලංසුකරුවන්ට 2026-04-10 දින සිට 2026-06-04 දින දක්වා 09.00 පැය සිට 15.00 පැය දක්වා පහත සඳහන් ලිපිනයේදී වැඩිදුර තොරතුරු ලබාගැනීමටත්, ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

**දුරකථන අංක : 94(11)2438078 හෝ 94(11) 4600202**
**ෆැක්ස් අංක : 94(11)2432044**
**ඊමේල්** : srs.slr@gmail.com, tenderl.srs@gmail.com
**වෙබ් අඩවිය** : www.railway.gov.lk

04. ලංසුකරු විසින්, මෙම ලංසුකරණ ලිපිලේඛනයෙහි දක්වා ඇති පිරිවිතරයන්හි සඳහන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පසුගිය වසර පහ සඳහා අදාළ අයිතම හෝ සමාන අයිතමයන් සැපයීම හා සැපයූ භාණ්ඩ පිළිබඳ කාර්යසාධන සහතික හා පසුගිය වාර්තා සමග ඉහත අයිතම මිලියන 5 ක ප්‍රමාණයක් සැපයීම සඳහා හැකියාව හා ධාරිතාවය තමන් සතු බව සනාථ කිරීම සඳහා ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. සේවාදායක ආයතනවලින් පසුගිය සැපයුම් වාර්තා පැහැදිලි විය යුතු අතර, අදාළ ලිපි ලේඛනවල ඡායා පිටපත් සියල්ලද පැහැදිලි විය යුතුය.

05. ශ්‍රී ලංකාව, කොළඹ 10 , ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 16,200.00 ක් හෝ පහසුවෙන් මාරුකරගත හැකි මුදල් වර්ගයක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2026-04-10 දින සිට 2026-06-04 දින 15.00 පැය තෙක් හෝ විදේශ ශ්‍රී ලංකා දූත සේවා කාර්යාලවලින් 2026-06-04 දින ශ්‍රී ලංකා වේලාව 15.00 පැය තෙක් අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

06. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවකින් නිකුත් කළ රු. 750,000.00 ක් වටිනා කොන්දේසි විරහිත ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

07. ලංසු 2026-06-05 දින 14.00 පැයට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාර දිය යුතු අතර, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද ලංසු භාර නොගැනේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

**යොමු අංක :** SRS/F.8154